# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. SGP/RP/D/UCB/FA/05/20/02 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 ජූනි 17 දින.

සභාපති,

බලංගොඩ නගර සභාව.

**බලංගොඩ නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

බී.ජී.අයි. නිරංජා.

සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව.

මගේ අංකය / எனது இல. / My No. } SGP/RP/D/UCB/FA/05/20/02 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 ජූනි 17 දින.

සභාපති,

බලංගොඩ නගර සභාව.

බලංගොඩ නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බලංගොඩ නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයට අදාළ මුද්දර ගාස්තු රු. 9,882,204 ක් වෙනත් ආදායම් වලට බැර කර තිබීම හේතුවෙන් වර්ෂයේ මෙහෙයුම් ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ජංගම නොවන වත්කම් මිලදී ගැනීම් හා වැඩි දියුණු කිරීම් එකතුව රු. 28,058,385 ක් වුවද, එය රු. 29,353,432 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු. 1,295,047 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොළී රු. 240,646 ක් උපලබ්ධිවීමට පෙර තැන්පතු ගිණුමට හර කර තිබීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත් ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණු අතර ජංගම වත්කම් සමාන වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) මුදල් මාරු ගිණුමේ රු. 9,307,943 ක ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

(ඉ) ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා වැය කරන ලද රු. 41,078 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඊ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට අතැති තොග ශේෂය රු. 5,613,943 ක් වුවද, උප ලේඛනය අනුව එම ශේෂය රු. 3,172,460 ක් වූයෙන් රු. 2,441,483 ක වෙනසක් පැවතුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු. 104,817 කින් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) පනතේ 6 (i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6 (i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 අනුකූල නොවීම්

### නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 වගන්තිය ප්‍රකාරව ප්‍රජාපාදක සංවිධානයක් ලෙස හඳුනාගත නොහැකි බලංගොඩ ග්‍රාම නිලධාරී සුභසාධන සංගමය වෙත රු. 550,000 ක වටිනාකමකට ෆළීල් හාජියාර් මාවත සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 23,422,086 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 1,604,413 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2020 | | | | 2019 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 10,880,000 | 10,993,748 | 9,740,380 | 4,273,339 | 8,745,000 | 8,149,957 | 7,356,497 | 3,021,434 |
| කුලී | 32,570,000 | 24,861,412 | 24,144,205 | 1,687,091 | 31,225,000 | 31,332,843 | 30,942,713 | 1,032,891 |
| බලපත්‍ර ගාස්තු | 1,790,000 | 1,587.817 | 1,519,818 | - | 4,710,000 | 4,406,843 | 4,378,290 | - |
| වෙනත් ආදායම් | 38,070,000 | 50,543,628 | 40,943,791 | 477,471 | 42,950,000 | 30,774,124 | 64,446,547 | 12,979,122 |
| | 83,310,000 | 87,986,605 | 76,348,194 | 6,437,901 | 87,630,000 | 74,663,767 | 107,124,047 | 17,033,447 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරෙන්තු හා දඩ යන ආදායම් විෂයයේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 87 කින් වැඩිවී තිබූ අතර වරිපනම් හා බදු, රජයේ දායකත්වය, බලපත්‍ර ගාස්තු සහ බදු කුළී යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 10 කින්, 10 කින්, 15 කින් සහ 26 කින් අඩු වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් රු. 4,273,339 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණු අතර, ඊට අදාළ කාල විශ්ලේෂණයක් ද සකස් කර නොතිබුණි.

(ආ) 2019 නොවැම්බර් 01 දිනැති ගැසට් පත්‍රය මගින් කසළ ගාස්තු අයකළ යුතු ආයතන වර්ග 14 ක් හඳුනාගෙන වාර්ෂික කසළ ගාස්තුව ප්‍රසිද්ධ කර තිබුණ ද කසළ ගාස්තු අයකළ යුතු ආයතන නිශ්චිතව හඳුනාගෙන නොතිබීම නිසා අයවිය යුතු ගාස්තු නියමිත පරිදි අයකරගෙන තිබේද යන බව විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

2.2.4 කුලී

-----

නගර සභාවට අයත් ඉම්පීරියල් ඉදිරිපිට කඩකාමර 14 ක් සඳහා දීර්ඝ කාලයක සිට අයනොවී පැවතුණු හිඟ කුලී රු. 199,250 ක් 2021 අප්‍රේල් වනවිටත් අයකරගෙන නොතිබුණි. නගර මධ්‍යයේ ඉහළ වාණිජමය වටිනාකමක් සහිත ස්ථානයක පිහිටි මෙම කඩ කාමර සඳහා මසකට රු. 1,500 ක කුලියක් අයකරමින් පැවති අතර එම බදු කුලිය වර්ෂ 05 කට වරක් සංශෝධනය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. අදාළ කඩ කාමර ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව බදුකරුවන් වෙත ලබා දී ඇති බව විගණනයේදී අනාවරණය වූ අතර හිඟ කුලී අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග වලට එළඹීමට එය බාධාවක් වී ඇති බව නිරීක්ෂණය විය.

2.2.5 බලපත්‍ර ගාස්තු

---------------

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබානොගත් කර්මාන්ත සම්බන්ධයෙන් නීතිමය කටයුතු කළයුතු වුවත්, 2019 හා 2020 වර්ෂ වලදී අළුත් කළයුතු පරිසර බලපත්‍ර 06 ක් අළුත්කර නොතිබීම සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් සභාවට රු. 24,000 ක ආදායමක් අහිමි වී තිබූ අතර, එම ආයතනවල ක්‍රියාකාරීත්වය තුළින් සිදුවන පාරිසරික බලපෑම පිළිබඳ කාලීන ඇගයීමක් ද සිදුව නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 445,326 ක් වූ අතර, 2020 මැයි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළව අයවිය යුතු මුද්දර ගාස්තු 2021 මාර්තු වනවිටත් හඳුනාගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරිම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) තිරසර සංවර්ධන ඉලක්ක

සභාව විසින් තිරසර සංවර්ධන සැලසුම් සකස් කර තිබුණ ද, සභාවේ විෂය පථයට අයත් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශක නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. එසේම හඳුනාගෙන තිබුණු අරමුණු හා ඉලක්ක වල ප්‍රගතිය ඉහළ ප්‍රතිශතයන්ගෙන් දක්වා තිබුණද ඊට අදාළ සංඛ්‍යාත්මක හා ලිඛිත දත්ත විගණනය වෙත ඉදිරිපත් කිරීමට සභාව අපොහොසත්වීම හේතුවෙන් ඒවා විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

2020 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් බල ප්‍රදේශයේ සංවර්ධනය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. 31,658,200 ක් වූ කර්මාන්ත 113 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද එකතුව රු. 30,258,200 ක් වූ කර්මාන්ත 110 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ වෙනුවට ඇස්තමේන්තුගත පිරිවැය රු. 21,151,079 ක් වූ වෙනත් කර්මාන්ත 52 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබීමෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක පුරප්පාඩු

(i) විධායක මට්ටමේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ලේකම් තනතුර 2001 ජූලි සිට පුරප්පාඩු වී තිබූ අතර රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ නිළධාරියෙකු 2016 සැප්තැම්බර් සිට ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කර තිබුණි.

(ii) මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරක්, පුස්තකාලයාධිපති තනතුරු 02 ක්, කළමනාකරණ සහකාර තනතුරක්, ආදායම් පරීක්ෂක තනතුරක්, පෙර පාසල් ගුරු තනතුරු 02 ක්, රියදුරු තනතුරු 03 ක්, ඖෂධ සංයෝජක තනතුරක් හා වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 05 ක් යන තනතුරු වල පවතින පුරප්පාඩු 15 ක් පිරවීමට කටයුතු කර නොතිබීමෙන් අදාළ කාර්යය සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව ඉටුකිරීමට බාධා වී තිබුණි.

(iii) 2016 මාර්තු 15 දින DMS/D/0217 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය මඟින් බලංගොඩ නගර සභාවේ ගිනි නිවීමේ ඒකකය සඳහා තනතුරු 20 ක් අනුමත කර තිබූ නමුත් එම තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවාගෙන නොතිබීම හේතුවෙන් ගිනි නිවීමේ ඒකකය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් විධිමත්ව ස්ථාපිත කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) සේවක ණය

2018 මැයි මස සිට සේවය හැරගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු. 76,114 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දීර්ඝ කාලයක සිට ඉදිරියට එන විවිධ අත්තිකාරම් රු. 8,680,970 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු රජයේ නිවාස 05 ක් සඳහා ආර්ථික කුලිය අයකරමින් පැවති අතර එකී ආර්ථික කුලිය 2010 වර්ෂයේ දී අවසන් වරට තක්සේරු කර තිබුණි. ආර්ථික කුලිය අයකරනු ලබන රජයේ නිවාස වසර 05 කට වරක් තක්සේරු කළයුතු වුවද 2021 අප්‍රේල් වනවිටත් නැවත තක්සේරුවක් සඳහා යොමුකර නොතිබුණි. 2010 වර්ෂයේදී සිදුකර තිබූ තක්සේරුව අනුව වරිපනම් අංක 217/17 දරන රජයේ නිවාසය සඳහා මසකට රු. 2,000 ක ආර්ථික කුලියක් අයකළ යුතු බව දක්වා තිබුණද 2013 දෙසැම්බර් දක්වා මාසිකව රු. 1,000 ක් පමණක් අයකර තිබූ අතර 2014 ජනවාරි සිට රු. 1,500 ක් පමණක් අයකරමින් පැවතුණි. එම හේතුවෙන් සභාවට අහිමි වී තිබූ කුලී ආදායම රු. 78,000 ක් විය.

(ඇ) බලංගොඩ නගර සීමාවේ ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, පරිපාලනය කිරීම, අධීක්ෂණය කිරීම හා දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම සඳහා 2018 වර්ෂයේ දී පිළියෙල කර තිබූ අතුරු ව්‍යවස්ථාව අනුමත කර ගැනීමට 2020 දෙසැම්බර් 31 වනවිටත් කටයුතු කර නොතිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 නිෂ්ක්‍රීය වත්කම්

ක්‍රීඩාපිටිය ආලෝකකරණය සඳහා 2019 දෙසැම්බර් මස මිලට ගෙන තිබූ රු. 125,750 ක් වටිනා විදුලි උපකරණ සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ගබඩාවේ නිෂ්කාර්යයව පැවතුණි.

#### 3.4.2 වාහන උපයෝජනය

2019 වර්ෂයේ අනතුරට ලක්වූ සභාව සතු ජේසීබී යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා රු. 108,807 ක් වැයකර තිබුණු අතර, රක්ෂණයෙන් රු. 93,807 ක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබුණි. මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුත්තන් නිශ්චය කර අලාභ අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

#### 3.4.3 පවරා නොගත් වත්කම්

නගර සභා කාර්යාලය, සභාවේ ආයුර්වේදය, කියවීම් ශාලාව, මහජන ක්‍රීඩාපිටිය හා ප්‍රේක්ෂකාගාරය පිහිටි ඉඩම්වල ලිඛිත අයිතිය නගර සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

නගර සභාවට අයත් බලංගොඩ තානායම 2017 පෙබරවාරි 28 දිනැති ගිවිසුම් පත්‍රය අනුව 2017 මාර්තු මස 01 දින සිට වර්ෂ 05 ක කාලයකට බදු දී තිබුණි. 2019 අප්‍රේල් 06 දින කපුගල වනජීවී කාර්යාලයේ අඩවි ආරක්ෂක ඇතුළු කණ්ඩායමක් විසින් සිදුකළ වැටලීමකදී තානායම තුළ තිබී ගෝන මස් කිලෝග්‍රෑම් 10 ක් සොයාගෙන තිබුණු අතර බලංගොඩ මහේස්ත්‍රාත් හා අතිරේක දිසා විනිසුරු විසින් බලංගොඩ තානායමේ කළමනාකරු වරදකරු කරමින් රු. 100,000 ක දඩයක් 2020 ජූනි 19 දින නියම කර තිබුණි. බදු ගිවිසුමෙහි 04 පරිච්ඡේදයෙහි (උ) වගන්තිය ප්‍රකාරව බදුකරු විසින් කිසියම් නීති විරෝධී ක්‍රියාවක් සිදුකළහොත් ඉන් ඔබ්බට බදුකරුට ඇති බදු අයිතිය සම්පූර්ණයෙන්ම අහෝසි විය යුතු වුවත්, එම කොන්දේසි ප්‍රකාරව සභාව කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 09 කට අදාළව එකතුව රු. 2,667,655 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 21 කට අදාළව ඉතිරිවීම් එකතුව රු. 31,906,295 ක් වූ අතර එය සියයට 21 ත් සියයට 98 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

බී.ජී.අයි. නිරංජා.
බී.ජී.අයි. නිරංජා.

සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.